# ග්‍රාමීය පාසල් ඵලදායීතාව කෙරෙහි විදුහල්පති නායකත්වය බලපාන ආකාරය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

**එස්. ඒ. එච්. සමරසිංහ**
***රුවන්පුර ජාතික අධ්‍යාපන විද්‍යා පීඨය***
***sahhadsan@gmail.com***

විශාල මානව, මූල්‍ය හා භෞතික සම්පත් ප්‍රමාණයක් යොදවා ඇති ක්ෂේත්‍රයක් බවට පාසල් අධ්‍යාපනය පත්ව තිබුණද පාසලෙන් ලබා දෙන අධ්‍යාපනය මෙන්ම පාසලද බොහෝ අවස්ථාවල විවේචනයට ලක්ව ඇත. ග්‍රාමීය පාසල් වැසී යාමේ ප්‍රවණතාවක් ද දක්නට ලැබෙයි. මේ සඳහා ග්‍රාමීය පාසල්වල ඵලදායීතාව ද බලපෑ හැකිය. ඒ අනුව ග්‍රාමීය පාසල්වල ඵලදායීතාව කෙරෙහි විදුහල්පති නායකත්වය බලපාන ආකාරය විමසා බැලීම මෙම අධ්‍යයනයෙන් අපේක්ෂිත විය. මෙහිදී, තම පාසල විසින් නිශ්චිතව හඳුනාගත් ප්‍රකාශිත අරමුණු කරා ළඟා වෙන පාසල ඵලදායී පාසලක් ලෙස හැඳින්වේ.

පාසලක ඵලදායීතාව කෙරෙහි බලපෑ හැකි සාධක කවරේදැයි විමසා බැලීම, තෝරාගත් පාසල්වල ඵලදායීතාව පිළිබඳ විමසා බැලීම, පාසලක ඵලදායීතාව කෙරෙහි විදුහල්පති නායකත්වය කෙතරම් දුරට බලපාන්නේ දැයි අධ්‍යයනය කිරීම, පාසල ඵලදායීතාව කරා ගෙන යාමේ දී විදුහල්පති නායකත්වය මුහුණ දෙන ගැටලු මොනවාදැයි විමසා බැලීම හා පාසල වඩාත් ඵලදායී ආයතනයක් බවට පත් කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග මොනවාදැයි යෝජනා කිරීම මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණු විය.

මෙම අධ්‍යයනය හිඟුරක්ගොඩ අධ්‍යාපන කලාපයේ මැදිරිගිරිය, හිඟුරක්ගොඩ, ඇලහැර යන අධ්‍යාපන කොට්ඨාසවල *1C* වර්ගයේ පාසල් හතරකට සීමා විය. අධ්‍යයනයේ නියැදිය එම පාසල්වල විදුහල්පතිවරුන් හා නියෝජ්‍ය විදුහල්පතිවරුන් 8 දෙනෙකුටත්, ගුරුවරුන් 120 දෙනෙකුටත්, සිසුන් 80 දෙනෙකුටත්, දෙමාපියන් 40 දෙනෙකුටත්, අධ්‍යක්ෂකවරුන් 5 දෙනෙකුටත් වශයෙන් මුළු නියැදිය 253 ට සීමා විය.

මෙහි දී විස්තරාත්මක පර්යේෂණ ප්‍රවේශය යොදාගත් අතර, සම්මුඛ සාකච්ඡා, ප්‍රශ්නාවලී, නිරීක්ෂණ හා ලිඛිත මූලාශ්‍රය මඟින් දත්ත රැස් කෙරිණි.

පර්යේෂණ අනාවරණ අතර පාසල් ඵලදායීතාව සඳහා බලපෑ හැකි ප්‍රධාන සාධක 13ක් හඳුනාගත හැකි වීම මූලික වේ. ඵලදායී පාසලක් ලෙස හඳුනාගත හැකි වූයේ එක් පාසලක් පමණි. විදුහල්පති නායකත්වය ඍජු ලෙසම පාසල් ඵලදායීතාව සඳහා බලපාන බව ප්‍රධාන තේමා 8 ක් යටතේ අනාවරණය කර ගත හැකි විය. පාසල් ඵලදායීතාව කරා ගෙන යාමේ දී විදුහල්පති නායකත්වය මුහුණ දෙන ගැටලු පුළුල් අංශ 4 ක් යටතේ හඳුනාගත හැකි විය. ඒ අනුව පාසලට සුවිශේෂ වන මට්ටමින් හා පොදුවේ ජාතික මට්ටමින් ගත හැකි විසඳුම් යෝජනා ඉදිරිපත් කරන ලදි.

***ප්‍රමුඛ පදඃ** ග්‍රාමීය පාසල්, පාසල් ඵලදායීතාව, විදුහල්පති නායකත්වය*